ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2015/02/27 |

## 2015 පෙබරවාරි මාසයේ දී උද්ධමනය සැලකිය යුතු ලෙස පහළ වැටේ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය 2015 පෙබරවාරි මාසයේ දී ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.6 දක්වා පහළ වැටිණි. එය 2004 ජනවාරි මාසයෙන් පසු වාර්තා කළ අඩුතම අගය වේ. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද 2015 ජනවාරි මස වාර්තා කළ සියයට 3.2 හි සිට 2015 පෙබරවාරි මාසයේ දී සියයට 2.9 දක්වා පහළ වැටිණි.



කො.පා.මි.දර්ශකය 2015 පෙබරවාරි මාසයේ දී පූර්ව මාසයට සාපේක්ෂව සියයට 2.3 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. 2015 ජනවාරි මස ඉන්ධන මිල ගණන් පහළ හෙළමින් සිදුකළ සංශෝධන සහ 2015 අතුරු අයවැය යෝජනාවන්ට අනුව ආහාර සහ ආහාර නොවන අයිතමයන්ගේ මිල ගණන් / ආනයන බදු අඩු කිරීම දර්ශකයේ මාසික පහළ යාම සඳහා බෙහෙවින් දායක විය. ආහාර නොවන කාණ්ඩයෙහි ද්‍රව ඉන්ධන, එල්පී ගෑස් සහ බස් ගාස්තුවල සැලකිය යුතු පහළ යාම් වාර්තා විය. සහල්, බොහෝ මත්ස්‍ය සහ එළවළු වර්ග වැනි ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන් පහළ යාම දර්ශකයේ මෙම මාසික පහළ වැටීම සඳහා තවදුරටත් උපකාරී විය. කෙසේ වුවද, බිත්තර, පොල්, පළතුරු සහ සමහර එළවළු වර්ගවල මිල ගණන් මෙම මාසය තුළ ඉහළයාමක් වාර්තා කළේය.

මෑතක දී පරිපාලිත මිල ගණන් පහත හෙළමින් සිදුකළ සංශෝධනවල බලපෑම හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයේ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සහ ප්‍රවාහන යන උප කාණ්ඩවල මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, රෙදිපිළි හා පාවහන් උපකාණ්ඩයේ මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වුවද, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩයන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2015 ජනවාරි මස පැවති සියයට 2.1 හි සිට 2015 පෙබරවාරි මාසයේ දී සියයට 0.8 දක්වා පහළ වැටිණි. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2015 ජනවාරි මස වාර්තා කළ සියයට 3.4 සමග සසඳන විට 2015 පෙබරවාරි මාසයේ දී සියයට 3.2 ක් විය.